# සමකාලීන ගතික සංහතික මාධ්‍ය සන්දර්භය තුළ රූපවාහිනී වැඩසටහන් වර්ගීකරණය

**ආචාර්ය ටියුඩර් වීරසිංහ**

රූපවාහිනී වැඩසටහන් වර්ගීකරණයේ විවිධ වූ නිර්ණායකයන්, පරාමිතීන් පවතින අතර, රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදන දෘෂ්ටිකෝණයට අනුව වර්ගීකරණය කර හඳුනා ගැනීම ඒ අතර ඉතා වැදගත් පැතිකඩකි. ප්‍රභේදනය යන්න මෙහි දී භාවිත කරන්නේ Genre 'ශානරය' යන ප්‍රංශ සංකල්පයෙන් අර්ථගන්වන කලා නිර්මාණ එකිනෙක වෙන් කර හඳුනා ගැනීම සඳහාය. මෙම පදයට සිංහල භාෂිත පද ලෙස ප්‍රභේදය, වර්ගය, ගණය, ප්‍රකාරය විභේදනය, ප්‍රවර්ගය ආදී හා සමානකම් දක්වන්නේය. ප්‍රභේදනය වනාහී, යථාර්ථය කලාරූපීව අවබෝධකර ගැනීමේ මිනිසා සතු බහුවිධ ශක්‍යතා මගින් තත්ත්වාරෝපණය වන්නා වූ ප්‍රකාශන මානයකි. ඉතිහාසය තුළ යථාර්ථය කලාපීයව අවබෝධ කර ගැනීමේ විවිධ ප්‍රයත්න දරා ඇත. එය බහුවිධ න්‍යායයික පර්යාලෝකනය තුළ විවිධ මූලධර්ම මත පාදක වී ඇති බව පෙනේ. ඒ අනුව ප්‍රභේදන වර්ගීකරණයේ දී තේමාත්මක, ව්‍යුහාත්මක, කෘත්‍යවාදාත්මක, පද්ධති විශ්ලේෂණාත්මක හා ආකෘතිකවේදාත්මක ආදී ප්‍රවේශ යොදා ගන්නා බව සඳහන් කළ යුතුය. මෙම සෑම ප්‍රවේශයක්ම සංකීර්ණ කලාත්මක නිර්මිතයේ හා ක්‍රියාකාරිත්වයේ යම් කිසි සීමාවක්, තලයක් සම්බන්ධව ප්‍රතිචාරයක් දක්වන්නේය. මෙම දෘෂ්ටිකෝණයට අනුව සාහිත්‍ය තුළ නවකතාව, කෙටිකතාව, කාව්‍ය, ගද්‍ය, ඓතිහාසික නවකතා, මනෝවිද්‍යාත්මක නවකතා, සමාජවිද්‍යාත්මක නවකතා, ශෝකාන්ත, ශෝක-සුඛාන්තය, අතිභාවය ආදිය ප්‍රභේදන ලෙස දැක්විය හැකිය.

කලාත්මක සංස්කෘතියේ ඉතිහාසය තුළ කලාත්මක ප්‍රභේදන වනාහී විවිධාකාර ලෙස ඇගයීමට සහ අර්ථකථනයට ලක් කර තිබේ. නිදර්ශනයක් වශයෙන් සම්භාව්‍ය සෞන්දර්යවාදය තුළ ප්‍රභේදන ප්‍රබල ධූරාවලීගත පද්ධතියක් තුළ ඉදිරිපත් කරමින්, ඒවා විදත්ද හා අවිදත්ද ලෙස බෙදා දක්වමින් ඒවා මිශ්‍ර කිරීම දැඩි ලෙස විවේචනයට ලක් කළේය. එහෙත් චමත්කාරවාදය කලාවේ ධූරාවලිගත සංකල්පය ප්‍රතික්ෂේප කර, එකම නිර්මාණයක් තුළ විවිධ ප්‍රභේදන භාවිත කිරීමේ අයිතිය තහවුරු කළේය.

ඓතිහාසික ක්‍රියාවලියේ දී කලාවේ හා සංස්කෘතියේ විභව්‍යතා හා ශාක්‍යතා වර්ධනය වීමත්, එහි අභ්‍යන්තර සම්බන්ධතා සංකීර්ණවීමත් හේතු කොට ගෙන කලාවේ හා සංස්කෘතියේ ප්‍රභේදන ප්‍රවීණතාවේ හැකියාවත් ද ප්‍රසාරණය වන්නේය.

රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහයේ බිහිවීමට සහ එහි වර්ධනයට ඊට පෙර වූ කලාත්මක සහ සන්නිවේදන මාධ්‍යවල ප්‍රභේදනවල බලපෑම අතිවිශාල බව අවධාරණය කළ යුතුය. නාට්‍ය, සිනමාව, සාහිත්‍ය ගුවන්විදුලිය ඒ අතර ප්‍රධාන වේ. රූපවාහිනිය ප්‍රාග්රූපවාහිනිය සංහතික මාධ්‍ය කාර්යයන්, ස්වරූප හා ක්‍රමවල ආභාසය ලබමින් සිය අනන්‍යතාව මෙන්ම එහි ප්‍රභේදනවල අනන්‍යතාව ද ගොඩනගා ගනී. (වීරසිංහ 2014) මේ අනුව රූපවාහිනී ප්‍රභේදන බිහිවීමට සහ එහි ඓතිහාසික හැඩගැස්ම එක් අතකින් ඊට පූර්වයෙන් වූ පොදු සාහිත්‍යයික හා සමාජ - දේශපාලනාර්ථ ප්‍රකාශ ලේඛන වේ. එය මෙන්ම අනෙක් අතින් නාට්‍යකරණය හා සිනමාව වැනි ප්‍රභේදවල සම්මිශ්‍රිත තත්ත්වයන්ගේ ද රූපවාහිනී මාධ්‍යයටම ආවේණික වූ දෘශ්‍ය ප්‍රකාශනාත්මක මාධ්‍යයන්ගේ සුවිශේෂ තාවන්ගේ ද නිර්මාණාත්මක ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස වර්ධනය වී තිබේ. සමාජයක් ලෙස සලකා බලන විට රූපවාහිනී ප්‍රභේදන ඊට පූර්වයෙන් වූ කලා ප්‍රභේදනවල විතරණයේ ප්‍රතිඵලයකි. වර්තමානයේදී රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේදන ව්‍යුහය හා ඒවායේ ගති ලක්ෂණ කෙරෙහි ප්‍රාග්රූපවාහිනිය සංහතික මාධ්‍ය හා කලාත්මක ප්‍රභේදනවල බලපෑම පමණක් නොව ඒ සඳහා පශ්චාත් රූපවාහිනී මාධ්‍ය හා කලාත්මක ගතිලක්ෂණවල බලපෑම ද ප්‍රබල සාධකයක් බව අවධාරණය කළ යුතුය. නිදර්ශනයක් වශයෙන් සමාකලීන රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේදන ව්‍යුහයට නව මාධ්‍ය හා නව්‍යාසන්න විඥාපන අවකාශයේ බලපෑම දැක්විය හැකිය. මේ නිසා මාධ්‍ය හා සන්නිවේදන තාක්ෂණයේ ප්‍රගතියත්, කලා-සංස්කෘතික හා සමාජ-දේශපාලන ක්ෂේත්‍රයේ ගතිකත්වයත් රූපවාහිනී මාධ්‍යයේ අභ්‍යන්තර වර්ධනයනුත්, ජනගහනයේ සමාජ ප්‍රජා විද්‍යාත්මක ප්‍රවණතා ආදියත් හේතු කර ගෙන රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේදන ව්‍යුහයේ විවිධ වෙනස්කම් හා විචල්‍යයන් ඇති විය හැකිය. රූපවාහිනී වැඩසටහන්වලට ආවේණික ජංගමශීලීත්වය හා සංශ්ලේෂියත්වය නිසා රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහය ස්වයං සිද්ධිමූලක ප්‍රපංචයක් ලෙස නොසැලකිය යුතු වන්නේය.

සංහතික මාධ්‍යවේදය තුළ ප්‍රභේදන විභේදනය සංලක්ෂිත වන්නා වූ පංචවිධ ගතිලක්ෂණ ඇත. ග්‍රාහක ස්වභාවය විෂයයික - තේමාත්මක ප්‍රවණතාව, විශේෂ අරමුණ සහගතභාව, කාලානුරූපිකතාව හා වාරිකභාවය ආදිය ඇතුළුව ග්‍රාහක ප්‍රවර්ධනාත්මක භාවය, විඥාපන පරිමාණය, ලලිතකලාත්මක-ප්‍රකාශන සහ ශෛලි රූපක ආදී සාධක රූපවාහිනී ප්‍රභේද නිර්මාණක සාධක ලෙස ඉදිරිපත් වන්නේය.

රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේදන අවබෝධය උසස් රූපවාහිනී සංස්කෘතියක් සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියකි. රූපවාහිනී ප්‍රභේදන පිළිබඳ අවබෝධය එම ප්‍රභේදන අතර අන්තර් සම්බන්ධතා වැටහීම, ප්‍රභේදන අනන්‍යතා, රූපවාහිනී ප්‍රභේදන සමාජ ජීවිතය තුළ දරන ස්ථානය සහ භූමිකාව සම්බන්ධ සවිඥානිකත්වය උසස් රූපවාහිනී සංස්කෘතික ලක්ෂණයකි. සමස්තයක් ලෙස සලකා බැලීමේදී ශ්‍රී ලංකාවේ රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේදන සම්බන්ධව පවතින තත්ත්වය පිළිබඳව කිසිසේත්ම සෑහීමකට පත් විය නොහැකිය.

රූපවාහිනී වැඩසටහන් සම්බන්ධව පොදු ප්‍රේක්ෂක වෘත්තිය සහ ශාස්ත්‍රාලයීය යන ත්‍රිත්වයම රූපවාහිනී වැඩසටහන් පිළිබඳ ව දක්වන ආකල්පය අති සරල වූ, සාමාන්‍ය මට්ටමක පවතී. විවිධ රූපවාහිනී ප්‍රභේදන හඳුනා ගැනීමේ දැනුම පොදු හා සරල මට්ටමක පවතින අතර, ඒ සම්බන්ධව

විශේෂිකරණයක් දක්නට ඇත්තේ නැත. එනම් රූපවාහිනී වැඩසටහන් සමස්තයක් ලෙස සංජානනය කරගන්නා අතර, ඒවා අතර විශේෂතා, වෙනස්කම් හඳුනා ගැනීම අවම මට්ටමක පවතී. මෙය රූපවාහිනී ප්‍රේක්ෂකයින් සඳහා පමණක් අදාළ නොවේ. අනෙක් පාර්ශ්ව සඳහා එහි තත්ත්වයේ විශාල වෙනසක් නිරීක්ෂණය නොවේ. ඒ අනුව රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදන පිළිබඳ අවබෝධය තුළ ත්‍රිත්වයක් ඔස්සේ සලකා බැලිය හැකිය. එනම් රූපවාහිනී ප්‍රභේදන අවබෝධය පිළිබඳ තල ත්‍රිත්වය කලාවේ සංහතික ප්‍රේක්ෂක තලය, නිර්මාණාත්මක වෘත්තිකතලය සහ ශාස්ත්‍රාලයීය තලයයි.

රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහයේ උසස් ප්‍රමිතියක් හා ගුණාත්මක භාවයක් අති කිරීම සඳහා මෙම ත්‍රිත්ව තල අතර පුළුල් අන්‍යෝන්‍ය අවබෝධයක් සහ සම්බන්ධතාවක් පැවැතිය යුතුය. විශේෂයෙන් අවසාන තල දෙක අතර මනා අවබෝධාත්මක සමායෝජනයක් තිබිය යුතුය.

ශාස්ත්‍රාලයීය තලයේ දී රූපවාහිනිය ප්‍රභේදන හා ප්‍රභේදන ව්‍යුහයේ න්‍යායයික සංකල්පීය අධ්‍යයන මගින් සම්පාදනය කෙරෙන දැනුම හා ඥානය ද, නිර්මාණාත්මක - වෘත්තීය තලයේදී ශාස්ත්‍රීය තලය මගින් සම්පාදිත දැනුම ආධාරකව රූපවාහිනී ප්‍රභේදන නිර්මාණ ද, සංහතික ප්‍රේක්ෂක තලයේ දී නිර්මාණාත්මක වෘත්තිය තලය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රභේදන පරිශීලනය මගින් ලබන දැනුම හා ඥානය ද සමස්තයක් වශයෙන් උසස් රූපවාහිනී සංස්කෘතියකට මඟ පාදනු ඇත.

රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේදන ව්‍යුහයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය වර්ධනය කිරීමෙහි ලා නිර්මාණාත්මක වෘත්තීය තලයේ නියුතු නිර්මාණකරුවන් සහ ශිල්පීන්ට අති විශාල කාර්යභාරයක් පැවරෙන්නේය. රූපවාහිනී ප්‍රභේදන පිළිබඳව ශාස්ත්‍රාලයීය තලය විසින් සම්පාදිත න්‍යායයික - සංකල්පීය දැනුම සිය නිර්මාණ ඔස්සේ භාවිතයට ගෙන ඒම සහ ඒවා ප්‍රේක්ෂක උපයෝගීතාවට අනුව ඉදිරිපත් කිරීම රූපවාහිනී නිෂ්පාදකයන්ගේ, අධ්‍යක්ෂවරුන්ගේ හා පොදුවේ රූපවාහිනී ප්‍රභේද නිර්මාණක-වෘත්තිකයින්ගේ කාර්යභාරය වේ. වර්තමාන ශ්‍රී ලාංකේය රූපවාහිනී වැඩසටහන් පද්ධතිය තුළ රූපවාහිනී ප්‍රභේද ව්‍යුහයේ අධ්‍යක්ෂණය විෂයයික මෙන්ම කාලීන වැදගත්කමක් උසුලන බව අවධාරණය කළ යුතුය. මෙය කාරණා කීපයක් නිසා වැදගත් වන බව අපගේ හැඟීමයි. සමකාලීන දෘශ්‍ය මාධ්‍ය තුළ විවිධාකාර වූ ද බහුවිධ වූ ද සංකීර්ණ ප්‍රභේදන රාශියක් පවතින බැවින් ඒවා නිවැරදිව හා නිශ්චිතව තෝරා බේරා ගැනීම සාමාන්‍ය සංහතික ප්‍රේක්ෂකයාට පමණක් නොව, නිර්මාණක වෘත්තිකයින්ට පවා දුෂ්කර වී ඇත. ඕනෑ ම රූපවාහිනී නිර්මාණයක් නිශ්චිත ප්‍රභේදයකට අයත් වන බැවින් සිය රූපවාහිනී නිර්මාණය කුමන ප්‍රභේදයකට අයත්වන්නේ ද යන්න ය. එසේ අවබෝධයක් එහි නිර්මාපකයා සතු විය යුතු නම්, කිරීමට අපේක්ෂිත රූපවාහිනී නිර්මාණයේ ඉහළ උපයෝගිතාවක්, සපල කාර්යක්ෂමතාවක් සහ නිර්මාණාත්මකභාවයක් ආරක්ෂා කර ගැනීම සඳහා සිය නිර්මාණය අයත්වන රූපවාහිනී විභේදනය පිළිබඳ මනා අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය සාධකයකි. ජීවිතයේ සිදු වන්නා වූ වෙනස්කම් මෙන්ම මානව අවශ්‍යතා ව්‍යුහයේ සිදුවන්නා වූ ගැඹුරු විපරිවර්තනයන් රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහය තුළ අනපේක්ෂිත වෙනස්කම් ඇති කිරීම කෙරෙහි බලපාන්නේය. වර්තමාන සමාජ ජීවිතය තුළ රූපවාහිනිය යනු වඩාත්ම ජංගමශීලී වූ ද සමීපතම වූ ද සංහතික මාධ්‍යයක් බව අමතක කළ යුතු නොවේ. එසේ රූපවාහිනී වෘත්තීය නිර්මාණ කරුවන්ගේ නිපුණතාව කුසලතාව සිය ප්‍රභේදන ක්ෂේත්‍රය තුළ වර්ධනය කර ගැනීම සඳහාත්, එහි ප්‍රවීණත්වයට හා වෘත්තිකභාවයට උපරිම අන්දමින් ළඟා වීම සඳහාත් රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහය පිළිබඳ න්‍යායාත්මක සංකල්ප හා ව්‍යවහාරික අවබෝධය අවශ්‍ය වන්නේය.

වර්තමාන ශ්‍රී ලාංකේය රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදන සංස්කෘතිය දෙස බැලීමේ දී එහි විශාල අඩුපාඩු, ප්‍රබල දුර්වලතා දක්නට ලැබෙන බව සඳහන් කළ යුතු ය. රූපවාහිනී ප්‍රභේදන

සාක්ෂරතාත්මක හා රූපවාහිනී ප්‍රභේදන විචාරාත්මක දෘෂ්ටිකෝණයට අනුව අදාළත ශ්‍රී ලාංකේය රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදන පද්ධතිය සොයා බැලීමේ දී එය අතා ප්‍රාථමික වූ ද අව්‍යක්ත වූ ද ක්‍රමවිරෝධී වූ ද නිර්ප්‍රමිතිය වූ ද තත්ත්වයක පවතින බව පෙනෙයි. මෙම තත්ත්වය රූපවාහිනී ප්‍රභේදනවල කලාත්මක, තාක්ෂණික, අන්තර්ගතමය, ආකෘතිකමය, සන්දර්භීය, ස්වරූපීය ආදී සියලු පැතිකඩ ඔස්සේ නිරීක්ෂණය කළ හැකිය.

ප්‍රවෘත්ති ප්‍රභේදය ඉදිරිපත් කිරීමේ (කියැවීමේදී) කියැවෙන පෙළ අර්ථවලට සවිලක ආකාරයට සමපාත වන වාච්‍ය ප්‍රාසංගිකභාවය ඉදිරිපත් නොපවතී. එනම් අර්ථ හා අර්ථ ප්‍රකාශන විධි අතර ප්‍රතිවිරෝධතා පවතී. රූපවාහිනී වාර්තා චිත්‍රපට ප්‍රභේදනයේ දී රූප දර්ශනය හා කථනය අතර සමාන්තර සමපාතතාව රහිතය. එනම් දෘශ්‍ය සංරචකය හා ශ්‍රව්‍ය සංරචකය අතර පරස්පරතා වේ. බොහෝ රූපවාහිනී ප්‍රභේදන සඳහා ආනුෂංගික අංගයක් ලෙස යොදා ගන්නා සංගීතය අදාළ රූපවාහිනී ප්‍රභේදයේ මූලික විෂයයික-තේමාත්මක ප්‍රවණතාව සමග අනුකූල නොවීම හා අදාළ ප්‍රභේදනයේ මූලික ගතිලක්ෂණ හා එහි සාක්‍ෂ්‍යමය අදහස් අභිභවා සංගීතය සෝෂාකාරී ලෙස ඉස්මතුවේ. බහුලව දක්නට ලැබෙන නිදර්ශන කිහිපයකි.

රූපවාහිනී ප්‍රභේදන පද්ධතිය තුළ ඒ ඒ ප්‍රභේදනයේ අවශ්‍යතාව මත ආනුෂංගික මාධ්‍යයක් ලෙස සංගීතයේ බහුවිධ කෘත්‍යයන් නිශ්චිතව හා නිවැරැදිව යොදා ගැනීම පොදුවේ රූපවාහිනී ප්‍රභේදනවල ගුණාත්මකතා කොන්දේසියකි. "රූපවාහිනී මාධ්‍යයේ ශ්‍රව්‍යමය පක්ෂය විවිධ තල ගණනාවකින් යුතුව විසිරී ඇත්තකි. මෙහි දී රූපයේ හා ශබ්දයේ ගැළපීම (Picture sound matching) පිළිබඳ නිර්මාණයක හා ප්‍රමිතීන් පිළිබඳව අවධානය යොමු කිරීම ද වැදගත්ය. (අලහකෝන් 2014) ශ්‍රී ලාංකේය රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේදන ව්‍යුහයේ ගුණාත්මක මට්ටම වර්ධනය කර ගැනීම සඳහා ශ්‍රී ලාංකේය රූපවාහිනියේ ප්‍රභේදන ව්‍යුහය පිළිබඳ පුළුල් පර්යාලෝකනයක යෙදීමින් එය ජාත්‍යන්තර මට්ටමේ රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහ සමග තුලනාත්මක අධ්‍යයන හුදු අනුකරණාත්මක හෝ යාන්ත්‍රික ආවේශයන්ගෙන් තොරවිය යුතුය. ඊට හේතුව රූපවාහිනී ප්‍රභේදන යනු ඒ ඒ සමාජවලට ආවේණික වූ සංස්කෘතික - ඓතිහාසික ක්‍රියාවලියක් තුළ බිහි වී, හැඩ ගැසීමට භාජනය වෙමින් පරිණාමය වන්නා වූ සමාජ - සංස්කෘතික හා දාර්ශනික - ප්‍රජාතනක ප්‍රපංචයක් බැවිනි. එනම් සමාජයක රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහය තුළ පොදු ලක්ෂණ මෙන්ම ඒ ඒ සමාජවලට ආවේණික වූ විශේෂතා දැකිය හැකිය. එය අදාළ සමාජයේ මානව ද්‍රව්‍යයෙන් වියුක්තව පවතින්නේ නැත. එහෙත් සමස්තයක් වශයෙන් රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහයේ සහ ඒ ඒ ප්‍රභේදනවල ආවේණික නියමයන් සහ නියමානුකූලතාවන් නිශ්චිතව හා නිවැරැදිව අනුගමනය කිරීම මගින් ශ්‍රී ලාංකේය රූපවාහිනී ප්‍රභේදනවල ප්‍රමිතිගත මට්ටමකට පත් කළ හැකිය.

මෙහි දී රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේදන වෙනස්වීම හෝ ප්‍රභේදන පද්ධතිය පරිණාමයට පත්වීම නොව එහි ප්‍රකාශන ශක්‍යතා නිරූපණය කරන නියමයන් හා නියමානුකූලතාවන් උල්ලංඝනය නොකිරීමයි. එහෙත් ශ්‍රී ලාංකේය රූපවාහිනිය සිය ප්‍රභේදනවල සහ ප්‍රභේදන ව්‍යුහයේ නියමයන් සහ නියමානුකූලතාවන් නිරන්තරයෙන්ම උල්ලංඝනය කිරීම බහුලව දක්නට ලැබේ. ඊට බලපාන කාරණා සහ කොන්දේසි ද තිබිය හැකිය. දැනුම, අත්දැකීම් හැරුණු විට මූල්‍ය, පරිපාලන, දේශපාලන වැනි සාධක නිසි ප්‍රමිතිය හා විද්‍යාත්මක පදනමක් මත පිහිටා රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදන නිර්මාණය බාධකව පවතින බව නිරීක්ෂණය කළ හැකිය. විශේෂයෙන් රූපවාහිනී කලාත්මක නිර්මාණයෙන් ඉවත්ව එය වෙළෙඳ පොළ හා දේශපාලන තර්කනයට යටත් වූ විට රූපවාහිනී නිර්මාණවල ප්‍රමිතිගතභාවය හා ගුණාත්මක භාවය බිඳ වැටීම වැළැක්විය නොහැකිය.

ලෝක රූපවාහිනී ප්‍රභේදන සාහිත්‍ය තුළ රූපවාහිනී ප්‍රභේදන පිළිබඳ සියලු දෙනාම එකඟවන පොදු අදහසක් හෝ සංකල්පයක් හෝ නොමැත. රූපවාහිනී ප්‍රභේදන ව්‍යුහ පිළිබඳ විවිධ න්‍යායයික සංකල්පීය ප්‍රවේශ තිබෙන අතර ඒ සඳහා විවිධ නිර්ණායකයන් ද යොදා ගැනේ.

රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදනකරණය (වර්ගීකරණය) සඳහා භාවිත කරන එක් ප්‍රවේශයක් ලෙස කෘත්‍යයික - ප්‍රවතාත්මක (Functiomal Trendeiiond Approchch) ප්‍රවේශය හැඳින්විය හැකිය. පොදු කෘත්‍යවාදී, බහුකෘත්‍යවාදී, ප්‍රබුද්ධවාදී, කලාත්මක විනෝදාස්වාදී හා ජනමතය හැඩ ගස්වන්නා වූ වැඩසටහන් එම ප්‍රවේශයට දායක වේ. දෙවන ප්‍රවේශය ලෙස විෂයයික - තේමාත්මක ප්‍රවේශය හැඳින්විය හැකිය. දේශපාලනික, ආර්ථික විද්‍යාත්මක, විද්‍යාත්මක, එසේම ස්වභාව ධර්මය පිළිබඳ වැඩසටහන්, භූගෝල විද්‍යාත්මක, සංචාරක සහ සමාජය සම්බන්ධතා ආදී වැඩසටහන් ඊට ඇතුළත් පුද්ගලික ජීවිතය පිළිබඳ, මෙන්ම සංකෘතිය, කලාව, ආගම, ක්‍රීඩාව, ඉතිහාසය ආදී ක්ෂේත්‍ර පිළිබඳ වැඩසටහන් වාර්තාමය - කලාත්මක, කලාත්මක-ක්‍රීඩාමය ආදී ස්වරූපයෙන් ඉදිරිපත් වේ. එසේම නාට්‍යානුසාරික, සංගීතමය, සාහිත්‍යමය ප්‍රභේදන ඊට අයත්ය. ශාලිකා, ශාලිකා බාහිර සජීවී සහ පටිගත කළ විවිධ පරාසයන් කරා පැතිරී යන වැඩසටහන් ද ඊට අයත් වේ. තුන්වන ප්‍රවේශය වන්නේ කාලානුරූපක ප්‍රවේශය යි. මෙහි දී පාදක කර ගන්නේ විකාශය කරනා කාලයයි. ඒ අනුව උදෑසන කාලය, දහවල් කාලය, සැන්දෑ කාලය, ඊට අයත් වේ. එසේම වයස් සීමා, ළැදියාවන්, අධ්‍යාපනය වෘත්තිකභාවය හා වෙනස් ලක්ෂණ මත ද අදාළ රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදන සකස් වන්නේය.

මෙම ප්‍රවේශයට අමතරව රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදන වර්ගීකරණය සඳහා දෘශ්‍ය - ශ්‍රව්‍යධ්වනික (Visual - Acoustic ප්‍රවේශය ද ගෙන හැර දැක්විය හැකිය. මේ ප්‍රවේශයේදී රූපවාහිනී ප්‍රභේදන වර්ගීකරණය කිරීම සඳහා පදනම් කර ගන්නා මූලික නිර්නායකය වන්නේ රූපවාහිනී තොරතුරු සම්ප්‍රේක්ෂණයේ දෘශ්‍ය - ශ්‍රව්‍යධ්වනික මාදිලියයි. මෙම ප්‍රවේශය අනුව රූපවාහිනී ප්‍රභේදන විකාශනයේ මූලික විශේෂත්වය හා එහි ස්වාභාවය වන්නේ දෘශ්‍ය ශ්‍රව්‍යධ්වනික ස්වරූපයෙන් යථාර්ථය පරාවර්තනය කිරීමයි.

රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදන වර්ගීකරණය පිළිබඳව පවතින බහුවිධ ප්‍රවේශ හා සංකල්ප අතරින් අප අවසාන ලෙස ගෙන හැර දැක්වූ රූපවාහිනී ප්‍රභේදන වර්ගීකරණය පිළිබඳ කෘත්‍යාධික - ප්‍රවර්ගතාත්මක ප්‍රවේශය (Funcional - Tendenaional Approchch) සහ දෘශ්‍ය - ශ්‍රව්‍යධ්වනික ප්‍රවේශය (Visual -Acoustic Approchch) යන ප්‍රවේශ ද්වය සවිස්තරව විග්‍රහ කර බැලීම වැදගත් ය.

මෙහි පළමු වන ප්‍රවේශයේ සංකල්පීය හා තාර්කික පදනම ලෙස ක්‍රියාකරන්නේ රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදන සමාජීය හා ඓතිහාසික ප්‍රපංචයක් ලෙස ගෙන විග්‍රහකිරීමයි. එනම් රූපවාහිනිය සමාජ සැකස්මේ ප්‍රතිඵලයක් ලෙස උත්පාදිකව අදාළ සමාජ-ඓතිහාසික ක්‍රියාවලිය පාදක ගතිලක්ෂණ කේන්ද්‍රිය කරගෙන රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේදන ව්‍යුහය සකස්වන බවයි. ඒ හෝ මේ සමාජයට සාපේක්ෂව රූපවාහිනී ප්‍රභේදනවල කාර්යානුසාරි හෝ ප්‍රවණතාත්මක පදනම මත අදාළ සමාජයෙන් රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේදන ව්‍යුහය ගොඩනැගෙන බව කෘත්‍යයික-ප්‍රවර්හතාත්මක ප්‍රවේශය මගින් අවධාරණය කෙරේ.

මෙම පළමු වන කෘත්‍යාධික ප්‍රවණතාත්මක ප්‍රවේශයට අනුව වර්තමාන රූපවාහිනීයේ වැඩසටහන් වර්ගීකරණය කාණ්ඩ 13කට දැක්විය හැකිය.

1. තොරතුරු (ප්‍රවෘත්ති) වැඩසටහන්
2. විශේෂී ප්‍රවෘත්තික තොරතුරු වැඩසටහන්
3. තොරතුරු - විශ්ලේෂණාත්මක වැඩසටහන්
4. සමාජ - දේශපාලනික විචාරාත්මක වැඩසටහන්
5. ප්‍රජානක - විනෝදාත්මක වැඩසටහන්
6. සංස්කෘතික - ආලෝකනමය වැඩසටහන්
7. මූලික ප්‍රරෝපණික (ළමා) වැඩසටහන්
8. ආගමික වැඩසටහන්
9. ක්‍රීඩා වැඩසටහන්
10. කලාත්මක වැඩසටහන්
11. බහු මාලාමය රූපවාහිනී චිත්‍රපට වැඩසටහන්
12. තොරතුරු විග්‍රහාත්මක - විනෝදන වැඩසටහන්
13. වෙළෙඳ ප්‍රචාරණවාදී වැඩසටහන්

- **තොරතුරු (ප්‍රවෘත්ති) වැඩසටහන්**

බොහෝ රූපවාහිනී නාලිකාවල සිය මුහුණුවර තීරණය කරන වැඩසටහන් වේ. මෙය නියමානුකූලව, නිසියාකාරව ක්‍රියාත්මක වන වැඩසටහන් ය. ඊට දේශාලනයේ සිට කාලගුණය දක්වා වූ සාමාන්‍ය ජනතාවට පමණක් නොව, සියලු මිනිසුන්ට වැදගත් වන්නා වූ තොරතුරු, දැනුම් දීම ආදිය අයත් වන්නේය. මෙය මිනිසුන්ගේ නොදැනීම, අවශ්‍යතාවන් සංතෘප්තමත් කරන නගරයේ, ප්‍රදේශයේ, පළාතේ, රටේ හා ලෝකයේ සිදුවන සිද්ධි පිළිබඳ ව්‍යවහාරික තොරතුරු මෙහි දී යහපත් හා අයහපත් ප්‍රවෘත්ති තෝරා ගැනීම සඳහා ඒවා තුලනාත්මක ඉදිරිපත් කිරීම අදාළ නාලිකාවේ සංස්කරණ ප්‍රතිපත්ති මූලික ප්‍රශ්නයකි.

- **විශේෂී ප්‍රවෘත්ති තොරතුරු වැඩසටහන්**

මෙයට එක් පැතිකඩක ප්‍රවෘත්ති ඇතුළත්වන අතර, එය සාපරාධී, ක්‍රීඩාතරඟ, විලාසිතා, කෘෂිකර්මාන්තය, වෛද්‍ය විද්‍යාව, ආර්ථිකය ආදී සමාජ ජීවිතයේ එක් පැතිකඩක ප්‍රවෘත්ති මූලික වශයෙන් මෙම ප්‍රභේදයට අයත් වේ. එසේම මැතිවරණ ව්‍යාපාරයට අපේක්ෂකයින් පිළිබඳ පූර්ව ප්‍රවෘත්ති ද මීට ඇතුළත් කළ හැකිය.

- **තොරතුරු විශ්ලේෂණාත්මක වැඩසටහන්**

මෙය නිශ්චිත කාලානුරූපීය රාමුවක් (සතිකව, මාසිකව) පද්ධතික ක්‍රමික සංගෘහිත කළ තොරතුරු සමාලෝචනාත්මක පරිගතයන් තුළ ඉදිරිපත් කිරීමකි. මෙහි මූලික අරමුණ ලෙස පවතින්නේ නිශ්චිත ගැටලු හා ප්‍රශ්න පිළිබඳව ජන මතය හැඩ ගැස්වීමය.

- **සමාජ - දේශපාලනික විචාරාත්මක වැඩසටහන්**

මේ වැඩසටහන්වලට කාලීන සිදුවීම සමඟ වන සම්බන්ධතාව අනිවාර්ය නොවේ. විශේෂයෙන් තොරතුරු විශ්ලේෂණාත්මක හා සාකල්‍යමය ප්‍රවේශයකින් ඉදිරිපත් කිරීම මූලික වේ.

මෙම වැඩසටහන් මගින් අදාළ නාලිකාවේ පුරවැසි ආස්ථානය විදහා දක්වයි. විශේෂයෙන් දැවෙන ප්‍රශ්නයක් සම්බන්ධව අදාළ නාලිකා ආස්ථානය ගෙන හැර දක්වමින් ප්‍රේක්ෂක මතය හැඩගස්වයි. මෙම ප්‍රභේදනයේ තේමාත්මක පරාසය විවිධාකාර විය හැකි අතර, මෙම වැඩසටහන තුළ විවිධ ප්‍රභේදන හෝ ඒ හා සම්බන්ධ සංඝටක හෝ තිබිය හැකිය. එය ශාලිකා සාකච්ඡාවේ සිට රූපවාහිනී Ozepk දක්වා හෝ රූපවාහිනී වාර්තා චිත්‍රපටයක් දක්වා හෝ ව්‍යාප්ත විය හැකිය. පූර්ව මැතිවරණ රූපවාහිනී සංවාද ද සමාජ දේශපාලනික විචාරාත්මක ප්‍රභේදයට අයත් වන්නේය. මෙම රූපවාහිනී ප්‍රභේදයේ ගුණාත්මක භාවය තොරතුරුවල, සාධකවල අදහස්වල අද්විතියභාවය හා අලුත්කම ප්‍රවේශයන්ගේ නැවුම්භාවය මෙහෙයවන්නාවූ ආස්ථානය හා සමස්ත වැඩසටහන මෙහෙයවීමේ ශෛලිය සහ තාර්කිකභාවය මත රඳාපවතියි.

- **ප්‍රජානක විනෝදාත්මක වැඩසටහන්**

විඥාපනික - විනෝදාත්මක ප්‍රභේදය බොහෝ විට උදාසන රූපවාහිනී වැඩසටහන්වල දක්නට ලැබෙන ප්‍රභේදයකි. සමාජ හා දෛනික ජීවිතයේ විවිධ ක්ෂේත්‍ර හා පැතිකඩ පිළිබඳව විමර්ශනාත්මක වැඩසටහන් මෙයට ඇතුළත් වන අතර, බොහෝ විට මෙම අන්තර්ගත සාමාන්‍ය කතාබහ පරිසරයක් තුළ සිදු වේ. විශේෂයෙන්ම කථාබහ දර්ශන (Talk Show) ස්වරූපයෙන් සිදුවන්නේය. මෙම ප්‍රභේදයේ වඩාත්ම වැදගත් කර්තව්‍ය වන්නේ දැනුම්වත් කිරීම හා විනෝදනය අතර සමබරතාව පවත්වාගෙන යෑමය.

- **සංස්කෘතික - අධ්‍යාපනික වැඩසටහන්**

මෙම වැඩසටහන් වර්ගයට විවිධ රූපවාහිනී ප්‍රභේදන ඇතුළත් විය හැකි සේම විවිධ ප්‍රභේදන සංඝටක ඇතුළත් විය හැකිය. මිනිසා විසින් නිර්මාණය කරන ලද ආධ්‍යාත්මික සහ සංස්කෘතික හර පද්ධති හා වටිනාකම් ප්‍රේක්ෂකයින්ට හඳුන්වා දීම මේ රූපවාහිනී වැඩසටහන් තුළ වන අතර විවිධ ප්‍රභේදන ඔස්සේ මානව ශිෂ්ටාචාරයේ සහ සංස්කෘතියේ ජයග්‍රහණ නිතර ඉදිරිපත් කරන බව පෙනේ.

- **ප්‍රරෝපණික (ළමා) වැඩසටහන්**

මෙම වැඩසටහන් පූර්ව පාසල්, පාසල් ගැටවර විය සහ තරුණ පිරිස් පාදක කරගෙන විකාශනය වේ. මෙහි මූලික අරමුණ වන්නේ වර්ධනය වන්නා වූ පරපුර ශික්ෂණය කිරීම අධ්‍යාපනය ලබා දීම, සමාජානුයෝජනය කිරීම ආදිය වේ. මෙම වැඩසටහන්වල ප්‍රභේදනමය විවිධත්වය අතිශයින්ම පුළුල් පරාසයක පැතිර පවතී. එය කාටූන්, සජීකරණය, කලාත්මක චිත්‍රපට, රූපවාහිනී තරග, ජනප්‍රිය විද්‍යා වැඩසටහන්, පාසල් ජීවිතය පිළිබඳ ටෙලිනාටක හා තවත් බොහෝ දෑ අයත් වේ.

- **ආගමික වැඩසටහන්**

මෙම වැඩසටහන් විවිධ ආගමික අදහස් විශ්වාස හා ඒවා සමවන වටිනාකම් ව්‍යාප්ත කිරීමෙහි ලා ක්‍රියාත්මක වේ. මෙම ආගමික වැඩසටහන් ද විවිධ ප්‍රභේදන ඔස්සේ ඉදිරිපත් විය හැකිය.

- **ක්‍රීඩා වැඩසටහන්**

බොහෝ රූපවාහිනී නාලිකාවල සැලකිය යුතු ප්‍රමාණයක් ක්‍රීඩා තරග, ක්‍රීඩාවේ ගැටලු සම්බන්ධ තොරතුරු විවිධ ප්‍රභේදන ඔස්සේ ඉදිරිපත් වේ.

- **කලාත්මක වැඩ සටහන්**

මේ යටතේ සිනමා දර්ශන, රූපවාහිනී චිත්‍රපට ප්‍රදර්ශනය කෙරෙන අතර ඒවා විනෝදාත්මක ස්වභාවයක් ගන්නේය.

- **බහුමාලාමය රූපවාහිනී චිත්‍රපට වැඩසටහන්**

මෙම රූපවාහිනී වැඩසටහන් වර්ගය කලාත්මක සිනමා පටවලින් වෙනස්ය. බොහෝ විට එකම ආකාරයේ ප්‍රමිතිගත කලා අධ්‍යක්ෂණ අවස්ථාවන් පාදක කරගෙන දිග හැරෙන බහුමාලාමය රූපවාහිනී චිත්‍රපට විශේෂ වශයෙන්ම හුදු විනෝදය සඳහා නිර්මාණය කෙරේ. සමස්තයක් ලෙස මෙම වැඩසටහන්වලට අයත් වන රූපවාහිනී ප්‍රභේදන බෙහෝ විට ඉහළ ප්‍රේක්ෂක ප්‍රතිචාර ලබා ගන්නා අතර, බහුමාලාමය රූපවාහිනී චිත්‍රපටවලට බොහෝ පිරිස් ඇබ්බැහිවීම හේතු කොට ගෙන රූපවාහිනී ප්‍රේක්ෂකයින් සැබෑ ජීවන යථාර්ථයෙන් ඉවතට යොමුවීමක් සිදු වේ. මෙහි ප්‍රභේදන ව්‍යුහය සටන්කාමී, රහස් පරීක්ෂක, භාවාතිශය නාට්‍ය, රූපවාහිනී නවකතා, රූපවාහිනී සුඛාන්ත, ත්‍රාසජනක නිර්මාණ ආදිය ඊට ඇතුළත් වේ.

- **තොරතුරු විග්‍රහාත්මක විනෝදන රූපවාහිනී වැඩසටහන්**

සමකාලීන රූපවාහිනී වැඩසටහන් ව්‍යුහයේ ප්‍රමුඛ ප්‍රවණතාවක් බවට පත් වී ඇති අතර, තොරතුරු විග්‍රහාත්මක විනෝදාත්මක ගති ලක්ෂණ අන්තර්ගත වන ආකාරයේ වැඩසටහන් මාදිලි වර්ධනය වෙමින් පවතී. යථාකාර රූපවාහිනී වැඩසටහන්, පිළිසඳර වැඩසටහන්, සංවාද වැඩසටහන් ප්‍රභේදන ඊට අයත් වේ.

- **වෙළෙඳ ප්‍රචාරණවාදී වැඩසටහන්**

මෙම වර්ගීකරණයට අනුව අවියත් රූපවාහිනී වැඩසටහන් වර්ගය වන්නේ වෙළෙඳ ප්‍රචාරණ වැඩසටහන්ය.

රූපවාහිනී වැඩසටහන් වර්ගීකරණ පිළිබඳ අප ගෙන හැර දැක්වීමට අදහස් කරන දෙ වන ප්‍රවේශය වන දෘශ්‍ය-ශ්‍රව්‍යධ්වනික ප්‍රවේශයට අනුව රූපවාහිනි ප්‍රභේදන මූලික විශේෂත්වය නිර්ණය වන්නේ දෘශ්‍ය-ශ්‍රව්‍ය ප්‍රේක්ෂක සංජානනය මතය. මේ අනුව සියලුම රූපවාහිනී වැඩසටහන් ඒකපාත්‍රක (Monologue) කථෝපකථන (Diologue) හා වාර්තාමය - කලාත්මත (Document Artistic) වශයෙන් තුනකට බෙදා වෙන් කෙරේ.

මෙම වර්ගීකරණය යටතේ පළමු වන කණ්ඩායමට අයත් වන්නේ වැඩසටහන් තුළ තනි පුද්ගල කථනාත්මක ලක්ෂණ ඇතුළත් වැඩසටහන් වර්ගය ප්‍රවෘත්ති නිවේදක, සම්ප්‍රේෂක විචර්ණික ආදී භූමිකා ඇතුළත් රූපවාහිනී ප්‍රභේදන වැඩසටහන් ඊට නිදර්ශන ලෙස දැක්විය හැකිය.

කථෝපකථන රූපවාහිනී වැඩසටහන් කණ්ඩායමට සිද්ධි හා යථාර්ථයේ විවිධ පැතිකඩ නිරූපණය, ඉදිරිපත් කිරීම, දෙබස් හා සංවාදාත්මක ස්වරූපයෙන් සිදුවන වැඩසටහන් රූපවාහිනි සාකච්ඡාමය වැඩසටහන්, රූපවාහිනී සංවාදමය වැඩසටහන්, මාධ්‍ය සාකච්ඡා, පිළිසඳර වැඩසටහන්, සම්මුඛ සාකච්ඡා ආදී රූපවාහිනී ප්‍රභේද ඊට ඇතුළත් වේ.

**වාර්තාමය - කලාත්මක රූපවාහිනී වැඩසටහන්**

කණ්ඩායමේ ප්‍රභේදවල විශේෂ ලක්ෂණය වන්නේ යථාර්ථය නිරූපණයේ දී ශබ්දමය පසුවීමක් පළල් හඬ පිංතූරයක්, පසුතලයක් සහිතව විකාශනය වන වැඩසටහන්ය. වීදි සෝෂා, ගෘහස්ත

ක්‍රීඩාංගණ, අත්පොළසත් පාරිසරික හා ස්වාභාවික (මුහුදු රළ, ගෙරවිලි හඬ) කර්මාන්ත ශාලාවල හඬ ආදී විවිධ ශබ්ද ප්‍රභේද විවිධ කලාත්මක වාර්තාමය වැඩසටහන් තුළ අන්තර්ගත විය හැකිය. සංරක්ෂිත දර්ශන, චිත්‍රපට, ඡායාරූප, භූගෝලීය සිතියම්, චිත්‍ර ආදී ලක්ෂණ මේ වාර්තාමය කලාත්මක වැඩසටහන්වලට ඇතුළත් විය හැකිය. බොහෝ විට එවැනි රූපවාහිනී වැඩසටහන් තුළ සංගීතමය අංගයන් අඩංගු වේ.

මෙම රූපවාහිනී වැඩසටහන් වර්ගීකරණය කිරීම පිළිබඳ දෘශ්‍ය-ශ්‍රව්‍ය ධ්වනිත ප්‍රවේශයේ සහ කෘත්‍යයික -ප්‍රවණතාත්මක ප්‍රවේශයේ සංකල්පීය හා න්‍යායයික පදනම සහ ඒවා රූපවාහිනී වැඩසටහන් වර්ගීකරණය සඳහා පාදක කර ගෙන ඇති මූලික නිර්ධාරක, නිර්ණායක, පරාමිතීන් එකිනෙකට වෙනස්ය. ඉන් පළමු ප්‍රවේශය රූපවාහිනී මාධ්‍යයේ තාක්ෂණික හා තාක්ෂණිකවේදී විශේෂත්වය ද, දෙවන ප්‍රවේශය රූපවාහිනී මාධ්‍ය සමාජ - දේශපාලනික - සංස්කෘතික ප්‍රපංචයක් ලෙස, ගෙන අදාළ ක්ෂේත්‍රවල ගතික හා ප්‍රවණතාවලට අනුව රූපවාහිනී වැඩසටහන් වර්ගීකරණයකට ලක් කර ඇත.

රූපවාහිනී වැඩසටහන් පමණක් නොව, එහි ප්‍රභේදන ව්‍යූහය පවා නිශ්චිතවය හා පැහැදිලිව වෙන් කර හඳුනා ගැනීම දුෂ්කර කාර්යයකි. එක් අතකින් රූපවාහිනී මාධ්‍ය, තාක්ෂණික වශයෙන් ද විවිධ මාධ්‍යයන්ගේ තාක්ෂණික පදනම් හා ගතිලක්ෂණ සමග සම්බන්ධව සිය පරිණාමය තුළ තාක්ෂණික සංශ්ලේෂී මාධ්‍යයක් වශයෙන් නිර්මාණය වී තිබේ. අනෙක් අතින් ප්‍රාග් රූපවාහිනී සියලු කලා ප්‍රභේද, ප්‍රවණතාවල සංශ්ලේෂී ප්‍රකාශනයක් ලෙස ඉදිරිපත් වන්නේය. එසේම රූපවාහිනිය ක්‍රියාත්මක වන නිශ්චිත සමාජ සැකැස්මේ ගතිලක්ෂණවලට සහ එහි අවශ්‍යතාවලට අනුකූලව හැඩ ගැසීම ද රූපවාහිනී වැඩසටහන්වලට සහ එහි ප්‍රභේදන ව්‍යූහය සකස්වීම් කෙරෙහි බලපාන්නේය.

සමකාලීන රූපවාහිනියේ කලා නිර්මාණාත්මක වර්ධනයත්, එසේම රූපවාහිනී මාධ්‍යයේ නිර්මාණාත්මක හා තාක්ෂණික අභිසාරීකරණ ක්‍රියාවලියක් නිසා සම්භාව්‍ය රූපවාහිනී ප්‍රභේදනයේ පාරිශුද්ධතා අර්බුදයට යමින් පවතී. අන්තර්ප්‍රභේදන, පාර ප්‍රභේදන සහ බහුප්‍රභේදන ප්‍රවණතාවල වර්ධනය කැපී පෙනෙන ලෙස නිරීක්ෂණය වේ. මේ නිසා මේ කාලේ රූපවාහිනී වැඩසටහන් සහ ඒවායේ ප්‍රභේදන ව්‍යූහය ගතික වූ ද ජංගමශීලි වූ ද, සංශ්ලේෂී වූ ද, සංකලනය වූ ද, ලක්ෂණ පෙන්වන්නේය. එහෙත් ඇත්ත වශයෙන්ම රූපවාහිනී වැඩසටහන් හා එහි ප්‍රභේදන ව්‍යූහය සම්බන්ධව මූලික ගැටලුව වන්නේ එම ක්ෂේත්‍රය තුළ ඉහත අප පෙන්වා දුන් ගතික හා ප්‍රවණතා වර්ධනය වීම නොව, එම රාමු තුළ ඒවායේ ප්‍රමිතිගත පරාමිතීන් හා ගුණාත්මක තත්ත්වයන් පවත්වා ගෙන යෑමය. මේ නිසා මේ යුගයේ අන් කවරදාටත් වඩා රූපවාහිනී වැඩසටහන් හා එහි ප්‍රභේදන අධ්‍යයනය මගින් ඒවා පිළිබඳ සාක්ෂරතාව වර්ධනය කර ගැනීම ඉතා වැදගත්ය.

රූපවාහිනී ප්‍රභේදන ව්‍යූහය නිසි ප්‍රමිතියට අනුව පවත්වාගෙන යෑම ඉතා වැදගත් වන්නේ සමස්ත සංහතික තොරතුරු ප්‍රවාහය තුළ අදාළ ප්‍රභේදයේ අනන්‍යතාව හා ස්ථානය තේරුම් ගැනීමත් එම ප්‍රභේදය රූපවාහිනී ප්‍රේක්ෂකයින් සමග සිදුවන අන්තර් ක්‍රියාකාරිත්වයේ වඩාත් සඵල හා ප්‍රතිඵලදායික ක්‍රම සොයා ගැනීම සඳහාත්ය.

එසේම මේ අනුව පෙනීයන්නේ රූපවාහිනී ප්‍රභේදන ප්‍රේක්ෂක සංයුතිය, විෂයයික තේමාත්මක ප්‍රවණතාව, දෘශ්‍ය - ශ්‍රව්‍යධ්වනික විශේෂතා, කාලානුරූපීකතාව, වාරිකභාවය හා වෙන සංරචක ලක්ෂණවල අනුකූලව හඳුනා ගත හැකි බවයි. එසේම රූපවාහිනී වැසටහන්වල සහ එහි ප්‍රභේදන ව්‍යූහයේ ගතිලක්ෂණ නිර්ණය කිරීමේ තවත් එක් වැදගත් පදනමක් ලෙස සංහතික තොරතුරුවල

ස්වභාවය හා එහි කර්තෘත්ව සංරචකයයි. රූපවාහිනී අවකාශය ආරම්භක යුගයේ සිටම රූපවාහිනිය සංහතික තොරතුරු (විඥාපන) මාධ්‍යයේ අලුත් මාධ්‍යයක් ලෙස එහි ශක්‍යතා භාවිත කළේය. බහුවිධ රූපවාහිනී ස්වරූප නිර්මාණය කිරීමට සහ සෙවීමට එහි න්‍යායිකවේදියෝ සහ වෘත්තිකයෝ ප්‍රයත්න දැරූහ. ක්‍රමානුකූලව රූපවාහිනී තාක්ෂණයේ හා එහි කලාත්මක හා නිර්මාණාත්මක පැතිකඩවල සිදු වූ පරිණාමය, රූපවාහිනී මාධ්‍යය කලා සහ සන්නිවේදන මාධ්‍යයක් ලෙස එහි ශක්‍යතා ප්‍රසාරණය කළේය.

සමකාලීන මාධ්‍ය තාක්ෂණයේ සහ මාධ්‍ය නිර්මාණ පද්ධතියේ සිදු වූ ව්‍යුහාත්මක විපරිවර්තනයන් ඒකාග්‍ර හා අභිසාරී ප්‍රවණතා උත්සන්න වීමේ ප්‍රතිඵලයක් ලෙස බහුවිධ රූපවාහිනී නිර්මාණ ස්වරූප වර්ධනය විය. එයින් රූපවාහිනී අවකාශය පුළුල් වූ අතර රූපවාහිනී වැඩසටහන්වල ප්‍රභේද ව්‍යුහය කෙරෙහි තීරණාත්මක බලපෑමක් ද කළේය. මේ සන්දර්භය තුළ රූපවාහිනී ප්‍රභේදවල ගතිකත්වය හා ජංගමශීලිත්ව පමණක් අලුත් ප්‍රභේද බිහිවීමේ විභව්‍යතාව ද වර්ධනය වෙමින් පවතී. මෙහි දී රූපවාහිනී වෘත්තිකයන්ගේ සහ නිර්මාණකරුවන්ගේ භූමිකාව සංකීර්ණ වන අතර ඔවුන්ගේ සමාජ වගකීම ද ඉහළ යන්නේය.


1. වීරසිංහ ටියුඩර් (2014) රූපවාහිනී මාධ්‍යයේ ප්‍රභේදන ව්‍යුහය, ඓතිහාසික පරිණාමය සහ එහි ප්‍රමිතිකරණයේ ගැටලු // *රූපවාහිනී සමීක්ෂා* සංස්: සුගත් වටගෙදර, නන්දසේන පලිහක්කාර. ජී.ඒ. ජිනප්‍රිය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

2. අලහකෝන්, වරුණ (2014) ප්‍රබන්ධාත්මක රූපවාහිනී ශාතරයන්හි ආනුෂාංගික සංගීත භාවිතය // *රූපවාහිනී සමීක්ෂා* සංස්: සුගත් වටගෙදර, නන්දසේන පලිහක්කාර, ජී.ඒ. ජිනප්‍රිය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

3. Strokach A.A. (2005) *Fundamentals of Radiotele* - Journalism Moscow.